# පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
## (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය)
## පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ
## සම්පත්දායකවරුන් ලියාපදිංචි කිරීම - 2025

1999 අංක 31 දරණ පනත මගින් සංස්ථාපිත කරන ලද පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රමුඛ කාර්යය භාරය වන්නේ ශ්‍රී ලංකාවේ පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනයයි. ඒ සඳහා වන ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා සහ කෙටි කාලීන පුහුණු පාඨමාලාවල දේශණ පැවැත්වීම වෙනුවෙන් 2025 වර්ෂය සඳහා සම්පත්දායකවරුන් ලියාපදිංචි කරනු ලැබේ. එම ලියාපදිංචි කිරීමට අදාළ විෂයයන් පහත පරිදි වේ.

### ඩිප්ලෝමා පාඨමාලා

**පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය,එහි විකාශනය, කාර්යභාරය හා බලතල
- ශ්‍රී ලංකාවේ පළාත් පාලන මූල්‍ය ක්‍රමයේ විකාශනය සහ පළාත් පාලන මූල්‍ය කළමනාකරණයට අදාළ නෛතික පසුබිම
- කළමනාකරණ මූලධර්ම
- පළාත් පාලන ආයතනවල ආදායම් කළමනාකරණය හා වියදම් කළමනාකරණය
- පළාත් පාලන ගිණුම්කරණය
- පළාත් පාලන ප්‍රසම්පාදනය
- පළාත් පාලන ආයතනයන්හි ණය කළමනාකරණය
- ව්‍යාපෘති කළමනාකරණය
- පළාත් පාලන විගණනය
- සහභාගිත්ව සැලසුම්කරණය හා අයවැයකරණය

**පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ විකාශනය
- ශ්‍රී ලංකාවේ වත්මන් පළාත් පාලන ක්‍රමය
- පළාත් පාලන ආයතන සඳහා කාර්යාල කළමනාකරණය
- පළාත් පාලන ආයතන සම්බන්ධ නීති
- පළාත් පාලන ආයතනවල සභා කටයුතු
- ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය (පළාත් පාලන ආයතනවලට අදාළ)
- පරිසර ආරක්ෂණය සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් සංවර්ධනයට දායක වීම
- ග්‍රාමීය සංවර්ධනය, සමාජ බලමුළු ගැන්වීම සහ මහජන සහභාගිත්වය සඳහා පළාත් පාලන අධිකාරියේ වගකීම්
- පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය
- ප්‍රජා මූලික ව්‍යාපෘති කළමනාකරණය

**මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

- කළමනාකරණ මූලධර්ම
- රැකියා සැලසුම් කිරීම
- කාර්ය මණ්ඩලකරණය
- මානව සම්පත් සංවර්ධනය
- ප්‍රතිදාන කළමනාකරණය
- කම්කරු කළමනාකරණ සබඳතා
- සංවිධාන චර්යාව
- කම්කරු නීතිය
- මානව සම්පත් කළමනාකරණයේ නව ප්‍රවණතා

**ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රාදේශීය ආණ්ඩුකරණය සහ මැතිවරණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

### සහතිකපත්‍ර පාඨමාලා

**දේශපාලන විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

- දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප
- දේශපාලන නායකත්වය
- ආණ්ඩුක්‍රම මාදිලි
- ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ආණ්ඩුක්‍රමය
- ශ්‍රී ලංකාවේ පළාත් පාලනය

**පළාත් පාලනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ නීතිමය පසුබිම
- පළාත් පාලන ආයතනවල බලතල සහ කාර්යයන්
- පළාත් පාලන ආයතනවලට අනුබද්ධ නීති (නීති, රෙගුලාසි සහ අතුරු ව්‍යවස්ථා)
- පළාත් පාලන ආයතනවල සභා කටයුතු
- පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය

**පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

- පළාත් පාලන ආයතනවලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන
- පරිපාලන නීතිය
- පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා සම්පාදනය
- පළාත් පාලන ආයතනවල සභා කටයුතු
- පළාත් පාලන ආයතනවල ගිවිසුම් ක්‍රියාවලිය
- පළාත් පාලන ආයතනවල දේපල කළමනාකරණය
- පළාත් පාලන ආයතනවල බදු පැනවීම සහ ආදායම්
- පළාත් පාලන ආයතනවල අධිකරණ කටයුතු

**ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**
**පරිසර ආරක්ෂණ සහ ඝන අපද්‍රව්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**
**පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**
**SPSS and NVivs software සහතිකපත්‍ර පාඨමාලාව**
**පුස්තකාල කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

### කෙටි කාලීන පුහුණු පාඨමාලා

1. මූලික විමර්ශනයන් පැවැත්වීම සහ චෝදනා පත්‍ර සකස් කිරීම
2. පෞද්ගලික ලිපිගොණු නඩත්තුව සහ නිවාඩු
3. ආකල්ප වර්ධනය සහ ධනාත්මක සිතුවිලි ඇතිකර ගැනීම
4. කාර්යාල කළමනාකරණය
5. පළාත් පාලන නීතිය
6. මැතිවරණ නීතිය
7. පළාත් පාලන ආයතනවල ආදායම් සහ බදු අයකිරීම
8. සභා කටයුතු
9. අනු නීති සහ අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ වැඩමුළුව
10. උසාවි කටයුතු
11. වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව සහ රැකියා ස්ථානයේ අනතුරු අවම කරගැනීම
12. රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය මගින් සංවර්ධන අරමුණු ඉටුකරගැනීම - PPP (Public Private Partnership)
13. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය
14. වැටුප් පරිවර්ථනය
15. මූල්‍ය කළමනාකරණය
16. පළාත් පාලන විගණනය

17. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
18. නගර සැලසුම්කරණය
19. 3R සංකල්පය හඳුන්වා දීම
20. කොන්ත්‍රාත් පරිපාලනය
21. විදුලි ඉංජිනේරු තාක්ෂණය
22. පරිසර බලපත්‍ර නිකුත් කිරීම හා නෛතික ක්‍රියාවලිය
23. සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි, නිවාස සහ නගර සංවර්ධන ආඥා පනත
24. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාව මැනීම සඳහා කාර්ය ඵල දර්ශක (KPI) ගොඩනැගීම
25. Excel for e-Governance and Research

ඉහත ක්ෂේත්‍රයන්හි මොඩියුල සකස් කිරීමට සහ දේශන පැවැත්වීමට උනන්දුවක් දක්වන විද්වතුන් අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ ඔබගේ විෂය ක්ෂේත්‍රය සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍රයක් **2025 ජූලි මස 31 දිනට පෙර** මෙම ආයතනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමුකළ යුතුය (**ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සම්පත්දායකවරුන් ලියාපදිංචි කිරීම-2025" ලෙස සඳහන් කරන්න**).

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ දෙවන ජාත්‍යන්තර සම්මන්ත්‍රනය 2025**

**මේ සඳහා පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

- මෙම සම්මන්ත්‍රනය සඳහා දේශීය හෝ විදේශීය පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රාදේශීය ආණ්ඩුකරණය පිළිබඳ විෂය ක්ෂේත්‍රයට අදාළ මහාචාර්යවරුන් දෙදෙනෙකුගේ සේවය සහ එසේම මෙම සම්මන්ත්‍රණය සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම පිළිබඳ අධ්‍යයනය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිත සම්පත්දායකුද අපේක්ෂා කෙරේ.
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා සම්බන්ධීකාරකවරයකු අවශ්‍ය වන අතර, ඉංග්‍රීසි භාෂා දැනුම සහ සම්මන්ත්‍රණ සම්බන්ධීකරණය පිළිබඳ පළපුරුද්ද ඇති අයෙකු වීම අපේක්ෂා කරනු ලබයි.
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරකවරයකු අවශ්‍ය වන අතර, ඒ සඳහා ඉංග්‍රීසි භාෂාව මනාව හැසිරවීමේ හැකියාව මෙන්ම ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සම්මබන්ධීකරණය පිළිබඳ පළපුරුද්ද සහිත අයෙකු වීම අත්‍යාවශ්‍ය වේ.

ඒ අනුව මේ සඳහා උනන්දුවක් දක්වන සහ සුදුසුකම් සපුරා ඇති විෂය ප්‍රවීණයන් වෙතින් අයදුම්පත් කැඳවන අතර, ඒ සඳහා වන අයදුම්පත් **2025 ජූලි 31** දිනට පෙර මෙම ආයතනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට කටයුතු කළ යුතුය. (අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2025"** සඳහා අයදුම්පත් යනුවෙන් සඳහන් කරන්න.)

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි**
**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය**
**නො.17 , මලලසේකර මාවත , කොළඹ 07**
දු.අ - **011-2508290** කාර්යාලය - **0112586259** **ෆැක්ස් - 011 -2581971** ඊමේල් - director@slilg.gov.lk